# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2346/42 - 2023 අගෝස්තු මස 23 වැනි බදාදා - 2023.08.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 අගෝස්තු මස 08 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය I

*පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම.*

*I වැනි තීරුව*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, පිහිටි පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්ට අයත් වන්නා වූ ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 396 සියඹලාවැව, අංක 343 සාලියගම, අංක 395 හක්වටුනාව, අංක 365 කෝරුවාව, අංක 374 රඹේ, අංක 372 මාළුපිළිය දකුණ, අංක 354 පොල්පිතිගම, 352 බෝගොල්ල, අංක 369 රාව ඇළ, අංක 368 බලගොල්ල, අංක 366 ගල්ටැංවැව, අංක 355 අමුණකොළේ, අංක 348 කිරිබමුණේගම, අංක 347 මඩගල්ල, අංක 371 මාළුපිළිය උතුර, අංක 373 අගාරේ, අංක 370 දාගම, අංක 353 කුඹුකුලාව, අංක 346 පතිරැන්නේගම යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සමන්විත වූ II තීරුවේ විස්තර වන ඉම් සහ මායිම්වලින් යුක්ත වූ මුළු මහත් ප්‍රදේශය වේ.

*II වැනි තීරුව*

*උතුරට :*

අංක 346 පතිරැන්නේගම ග්‍රාම නිලධාරී වසමේ බටහිර හා උතුරු මායිම් ඡේදනය වන ලක්ෂ්‍යයෙන් ආරම්භ වී එම වසමේ උතුරු මායිම ඔස්සේ ගිණිකොණ දෙසට ගමන් කර අංක 343 සාලියගම ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ඊශාන, උතුර, ගිණිකොන, දකුණ, නැවතත් ගිණිකොන හා ඊශාන දෙසට ගමන් කර (ගල්ගමුව - නිකවැව මාර්ගය හා මඩගල්ල - මොරගොල්ලාගම මාර්ගය ඡේදනය කරමින්) එම වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද,

*නැගෙනහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 343 සාලියගම ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණ, ගිණිකොණ හා නැවතත් දකුණ දෙසට ගමන් කර අංක 348 කිරිබමුණේගම ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ගිණිකොණ, දකුණ, නැගෙනහිර නැවතත් ගිණිකොණ හා දකුණු දෙසට ගමන් කර එම වසමේ දකුණු මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම ඔස්සේ බටහිර දෙසට ගමන් කර අංක 353 කුඹුකුලාව ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ දකුණ, ගිණිකොණ නැවතත් දකුණ දෙසට ගමන් කර අංක 352 බෝගොල්ල ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ නිරිත, දකුණ සහ ගිණිකොණ දෙසට ගමන් කර අංක 396 සියඹලාවැව ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ගිණිකොණ දෙසට ගමන් කර එම වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම ඔස්සේ නිරිත දෙසට ගමන් කර අංක 368 බලගොල්ල ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ගිණිකොණ හා දකුණ දෙසට ගමන් කර අංක 395 හක්වටුනාව ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන්සිට එම මායිම ඔස්සේ දකුණ හා නැගෙනහිර දෙසට ගමන් කර එම වසමේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ බටහිර හා දකුණු දෙසට ගමන් කර නැවතත් බටහිර දෙසට ගමන් කර අංක 373 අගාරේ ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ දකුණ හා නැගෙනහිර දෙසට ගමන් කර නැවතත් දකුණ, ගිණිකොණ සහ දකුණ දෙසට ගමන් කර එම වසමේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ බටහිර, දකුණ, වයඹ නැවතත් දකුණ හා වයඹ දෙසට ගමන් කර අංක 371 මා එළිය උතුර ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට මායිම ඔස්සේ දකුණ හා නිරිත දෙසට ගමන් කර අංක 372 මා එළිය දකුණ ග්‍රාම නිළධාරී වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ නිරිත හා දකුණ දෙසට ගමන් කර අංක 374 රඹේ ග්‍රාම නිලධාරී වසමේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ගිණිකොණ හා නැගෙනහිර දෙසට ගමන්

*I වැනි තීරුව* *II වැනි තීරුව*

කර එම වසමේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ දකුණ, නැගෙනහිර නැවතත් දකුණ දෙසට ගමන් කර එම වසමේ දකුණු මායිම හමුවන තෙක්ද,

*දකුණට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 374 රඹේ ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම ඔස්සේ බටහිර දෙසට ඉබ්බාගමුව - කුඹුක්ගැටේ මාර්ගය ඡේදනය කරමින් ගමන් කර එම වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර අංක 372 මාඑළිය දකුණ ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන තෙක්ද එතැන් සිට එම මායිම ඔස්සේ වයඹ හා බටහිර දෙසට ගමන් කර එම වසමේ බටහිර මායිම හමුවන තෙක්ද,

*බටහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 372 මා එළිය දකුණ ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ උතුර, වයඹ හා නිරිත දෙසට ගමන් කර අංක 371 මා එළිය උතුර ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ වයඹ හා ඊශාන දෙසට ගමන් කර අංක 370 දාගම ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ඊශාන හා වයඹ දෙසට ගමන් කර නැවතත් උතුරු දෙසට ගමන් කර අංක 365 කෝරුවාව ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ නිරිත දෙසට ගමන් කර එම වසමේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ බටහිර දෙසට මඩගල්ල මොරගොල්ලාගම මාර්ගය ඡේදනය කරමින් එම වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුර හා ඊශාන දෙසට ගමන් කර අංක 366 ගල්ටැංවැව ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ ඊශාන හා උතුර දෙසට ගමන් කර අංක 354 පොල්පිතිගම ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු දෙසට ගමන් කර අංක 355 අමුණුකොළේ ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ වයඹ දෙසට ගමන් කර එම වසමේ බටහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු හා වයඹ දෙසට ගමන් කර එම වසමේ උතුරු මායිම හමුවන තෙක්ද (මහව-මඩගල්ල) මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක්ද) එතැන් සිට එම මායිම ඔස්සේ උතුරු, වයඹ හා ඊශාන දෙසට ගමන් කර ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ.

EOG 08 - 0259

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.